තෝරාගත් මහා විද්‍යාලයක 6–9 දක්වා ශ්‍රේණි ඇසුරෙන් නුදුරු අනාගතයේදී අකාලයේ ගිලිහීමට ඉඩ ඇති සිසුන්ගේ ප්‍රමාණය සහ ඒ ආශ්‍රිත අධ්‍යාපනික, ආර්ථික හා සමාජීය සාධක පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ දර්ශනපති (අධ්‍යාපන විද්‍යා) පශ්චාත් උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන නිබන්ධනය

වික්‍රමකුලතිලක මුදලිගේ ලීලාසෝම පද්මිනී විජේසේකර

UCLIB
386642

1983 පෙබරවාරි

## සංක්ෂේපයෙන්

සිසුන් අකාලයේ පාසල් හැරයාම වත්මන් අධ්‍යාපන ක්ෂෙත්‍රයේ දක්නට ලැබෙන ප්‍රධාන අධ්‍යාපන ගැටළුවලින් එකකි. අනාගතයේදී අකාලයේ ගිලිහීමට ඉඩ ඇති සිසුන් හඳුනා ගැනීම සහ ඊට ප්‍රතිකර්ම යෙදීම ගැන සොයා බැලීමට කරන ලද පර්යේෂණ තවමත් ශ්‍රී ලංකාවේ අඩු බව පෙනී යයි.

තෝරාගත් මහා විද්‍යාලයක 6–9 දක්වා ශ්‍රේණි ඇසුරෙන් නුදුරු අනාගතයේදී අකාලයේ පාසලින් ගිලිහීමට ඉඩ ඇති සිසුන්ගේ ඒ තත්ත්වය ආශ්‍රිත අධ්‍යාපනික, ආර්ථික, සමාජීය සාධක සහ යෙදිය හැකි ප්‍රතිකර්ම සම්බන්ධයෙන් කරන ලද මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ, ගුරුවරුන් ප්‍රමුඛ පාසල මගින් නුදුරු අනාගතයේදී අකාලයේ පාසලින් ගිලිහීමට ඉඩ ඇති සිසුන් හඳුනා ගන්නා ආකාරය සහ එයින් වැළැක්වීමට ගත හැකි ක්‍රියා මාර්ග ගැන සොයා බැලීමයි. එම ප්‍රතිකර්ම යම්කිසි කාල පරිච්ඡේදයක් තුළ ක්‍රියාවේ යොදා අත්හදා බැලීම තවත් අරමුණකි.

පසුගිය වර්ෂ කීපය තුළ අකාලයේ පාසල් හැරයාම වැඩිපුර දක්නට ලැබුණු ගම්බද මිශ්‍ර මහා විද්‍යාලයක 6–9 දක්වා ශ්‍රේණිවල සිසුන් ඇසුරෙන් නියැදිය සකස් කෙරිණි. ගැඹුරට අධ්‍යයනය කළ යුතුව තිබුණු නිසා එක් පාසලක් පමණක් තෝරා ගන්නා ලදී.

මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය සඳහා දත්ත රැස්කිරීමේදී අදාළ සිසුන්, ගුරුවරුන් සඳහා දෙමව්පියන් සඳහා ඉදිරිපත් කළ ප්‍රශ්නාවලි, සිසුන්ට ඉදිරිපත් කළ බුද්ධි පරීක්ෂණ පොරුෂමාන , සමාජමිති පරීක්ෂණ, සිසුන් දෙමව්පියන් ගුරුවරුන් සහ විදුහල්පති සමග කළ සම්මුඛ සාකච්ඡා, සහභාගිත්ව නිරීක්ෂණ, සිසුන් පාසලට ඇතුළත් කර ගැනීමේ ලේඛන, පැමිණීමේ ලේඛන, වාර පරීක්ෂණ ලකුණු වාර්තා, සෞඛ්‍ය වාර්තා ආදිය ඇතුළු අදාළ පාසල් ලේඛන සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබාගත් සිසුන් අකාලයේ ගිලිහීම සහ නැවත රැඳී සිටීමේ ප්‍රමාණ දක්වන සංඛ්‍යා ලේඛන දත්තද උපකාරී විය. මෙම අධ්‍යයනයේදී විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය අනුගමනය කරනු ලැබීය. දත්ත විශ්ලේෂණය කිරීමේදී සියයට

ගණන්, සංඛ්‍යා වගු ප්‍රස්තාර ටැම් රූ සටහන් ආදිය උපයෝගී කර ගන්නා ලදී.

මෙම නිබන්ධයේ පළමුවන පරිච්ඡේදයෙන් අකාලයේ ගිලිහීමේ ගැටළුව ගැන හැඳින්වීමක් දී ඇත. එම පරිච්ඡේදයේ අකාලයේ ගිලිහෙන්නන් පිළිබඳ වර්ගීකරණය අකාලයේ ගිලිහීමේ ප්‍රශ්නය සම්බන්ධ ගැටළු සහ ලෝකයේ විවිධ රටවල අකාලයේ පාසල් හැර යන්නන්ගේ ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යා ලේඛන ආශ්‍රිත දත්ත, විස්තර වශයෙන් දැක්වෙයි.

දෙවන පරිච්ඡේදයෙන් අකාලයේ ගිලිහීම පිළිබඳ පර්යේෂණ සාහිත්‍යය ගැන විමර්ශනයක් කර තිබේ. මෙහිදී ජාත්‍යාන්තර මට්ටමේ සමීක්ෂණ ගැන මුලින්ම දැක්වේ. ඉන්පසු අප්‍රිකාව, ආසියාව, ඕස්ට්‍රේලියාව, නැගෙනහිර යුරෝපය, බටහිර යුරෝපය, උතුරු අමෙරිකාව, ලතින් අමෙරිකාව යන රටවල අකාලයේ ගිලිහීම සම්බන්ධව කර ඇති කෘති විශේෂයෙන්ම 1970 – 80 දශකයේ දී කරන ලද කෘතීන්ද ඇතුළත් වන ආකාරයට, අදාළ පර්යේෂණ සාහිත්‍යය ගැන විමසීමක් කර ඇත.

තුන්වන පරිච්ඡේදයෙහි ශ්‍රී ලංකාවේ සිසුන් අකාලයේ පාසල් හැරයාම පිළිබඳව සංඛ්‍යාලේඛන ආශ්‍රිත විස්තරාත්මක තොරතුරු දැක්වේ. මෙහිදී අධ්‍යාපන අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛන අංශයෙන් ලබා ගත් අදාළ සංඛ්‍යා ලේඛන ද ඇතුළත් වන සේ අප රටේ මෑතකදී කරන ලද අදාළ පර්යේෂණ ගැන සවිස්තර විග්‍රහයක් කෙරේ.

හතරවන පරිච්ඡේදය තෝරාගත් මහා විද්‍යාලයක 6–9 දක්වා ශ්‍රේණි ඇසුරෙන් නුදුරු අනාගතයේදී අකාලයේ ගිලිහීමට ඉඩ ඇති සිසුන් හඳුනා ගැනීම සහ ඊට අදාළ විස්තර දැක්වීම සඳහා වෙන් කර ඇත. මෙහිදී මුලින්ම පර්යේෂණාත්මක අධ්‍යයනය සඳහා මහා විද්‍යාලයක් තෝරාගත් ආකාරය සහ එසේ තේරීමට හේතුව විස්තර කෙරේ. ඉන්පසු පාසල් පැමිණීමේ අඩුකම, පන්තිවල නැවත රැඳී සිටීම ආදී විචල්‍ය 10 ක් යටතේ අකාලයේ ගිලිහීමට ඉඩ ඇති සිසුන් හඳුනා ගත් ආකාරය ගැන විස්තර දැක්වෙයි.

පස්වන පරිච්ඡේදයෙන් අදාළ සිසුන් අනාගතයේදී අකාලයේ ගිලිහීමට තුඩුදෙන සාධක පිළිබඳ විග්‍රහයක් දක්වා තිබේ. මෙහිදී පාසල් පද්ධතිය ආශ්‍රිත සාධක ගැන විග්‍රහයක් මුලින්ම දැක්වේ. අකාලයේ ගිලිහීමට ඉඩ ඇතිවීම සම්බන්ධව අදාළ සිසුන් තුළ දක්නට ලැබෙන බුද්ධිඵලය අඩුකම, සෞඛ්‍ය ගැටළු, ආදී පෞද්ගලික ගැටළු ගැන විග්‍රහයක් ඉන් පසුව එයි. සිසුන් අයත්වන පවුල්වල ආර්ථික තත්ත්වය, අකාලයේ ගිලිහීමට තුඩුදී ඇති අයුරුද, දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටම හා ඔවුන් සිය දරුවන් ගැන දරන අනාගත අපේක්ෂණ, අකාලයේ ගිලිහීමට ඉඩ ඇතිවීමට බලපාන ආකාරය විස්තර කෙරේ. අදාළ සිසුන් අකාලයේ ගිලිහීමට ඉඩ ඇතිවීම කෙරෙහි සමාජීය හා පරිසරාත්මක සාධක බලපාන අයුරු අන්තිමට විස්තර කර ඇත.

හයවන පරිච්ඡේදයෙන් අදාළ සිසුන් පාසලින් ගිලිහීම වැලැක්වීමට යෙදිය හැකි ප්‍රතිකර්ම යම්කිසි කාල පරිච්ඡේදයක් තුළ යොදා එහි ප්‍රතිඵල ගැන ඇගයීමක් කර ඇත. මෙහිදී පාසල ආශ්‍රිත, සිසුන්ගේ පෞද්ගලික ගැටළු ආශ්‍රිත, සිසුන්ගේ පවුල්වල ආර්ථික තත්ත්වය ආශ්‍රිත දෙමව්පියන් අධ්‍යාපනය කෙරෙහි දක්වන උනන්දුව සම්බන්ධ ආදී වශයෙන් අදාළ සෑම අංශයකින්ම යෙදිය හැකි ප්‍රතිකර්ම මාස 12 කට ආසන්න කාලයක් තුළ ක්‍රියාවේ යොදවා ලැබූ ප්‍රතිඵල ඇගයීමක් කර තිබේ.

හත්වන පරිච්ඡේදයෙන් ගැටළු සහිත සිසුන් අතරින් කැපී පෙනෙන වෙනස්කම් ඇති සිසුන් තුන්දෙනෙකු තෝරාගෙන ඔවුන් ගැන ගැඹුරු අධ්‍යයනයක් කර ප්‍රතිකර්ම යොදා එහි ප්‍රතිඵල ගැන ඇගයීමක් කර ඇත.

අටවන පරිච්ඡේදයෙන් පර්යේෂකයා මෙම අධ්‍යයනයෙන් හෙළි කර ගත් කරුණු ගැන දී ඇති නිගමන දැක්වේ. අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ සිසුන් අකාලයේ පාසල් හැරයාම අඩුකිරීම සඳහා යෙදිය හැකි ප්‍රතිකර්ම යෝජනා කර තිබේ.